සංතරණ'24

SANTHARANA'24

## "සංතරණ'24" සමස්ත ලංකා අන්තර් පාඨශාලයීය ත්‍රෛභාෂා මාධ්‍ය දින තරගාවලිය නීති රීති සහ රෙගුලාසි

- සංතරණ'24 සමස්ත ලංකා අන්තර් පාඨශාලයීය ත්‍රෛභාෂා මාධ්‍ය දින තරගාවලිය 2024 අප්‍රේල් මස 07 වන ඉරිදා දින පෙරවරු 07.00 සිට පස්වරු 05.00 දක්වා පුෂ්පදාන බාලිකා විද්‍යාලයීය පරිශ්‍රයේ දී පැවැත්වීමට නියමිතය.

- තරග අංශයන් සඳහා වලංගු වයස් කාණ්ඩ,
  - කණිෂ්ඨ අංශය - 2013, 2012, 2011 වර්ෂවල උපත ලැබූවන්
  - අන්තර්මධ්‍යම අංශය - 2010, 2009, 2008 වර්ෂවල උපත ලැබූවන්
  - ජ්‍යෙෂ්ඨ අංශය - 2007, 2006, 2005 වර්ෂවල උපත ලැබූවන්

- තරගාවලියට සහභාගී වන සියලු ම තරගකරුවන් 2005.01.31 දිනට පසු ව උපන් අය විය යුතු ය.

- නිවේදන, හඬකැවීම්, සංස්කරණය, ක්‍රීඩා විස්තර විචාරය, තාක්ෂණික ඉසව්ව, කාටූන් චිත්‍ර නිර්මාණකරණය සහ ඡායාරූපකරණය යන තරග අංශ භෞතිකව පවත්වනු ලබන අතර ග්‍රාෆික නිර්මාණකරණය, කෙටි චිත්‍රපට , ගුවන්විදුලි වැඩසටහන් ඉදිරිපත්කරණය සහ පුවත් හසුන් නිර්මාණකරණය යන තරඟ අංශ මාර්ගගත ක්‍රමයට පැවැත්වේ.

- එක් තරගකරුවකුට සහභාගී විය හැක්කේ එක් තරග අංශයක් සඳහා පමණක් වේ. (කෙටි චිත්‍රපට, ගුවන්විදුලි වැඩසටහන් ඉදිරිපත් කිරීම හා පුවත් හසුන් නිර්මාණකරණය යන තරග අංශ සඳහා මෙම කරුණ අදාල නොවේ.)

- එක් පාසලකින්, එක් තරඟ අංශයක එක් වයස් කාණ්ඩයක් සඳහා සහභාගී විය හැක්කේ තරගකරුවන් දෙදෙනෙකුට පමණි. (සංස්කරණය, කෙටි චිත්‍රපට, පුවත් හසුන් නිර්මාණකරණය හා ගුවන්විදුලි වැඩසටහන් ඉදිරිපත් කිරීම යන තරග අංශ සඳහා මෙම කරුණ අදාළ නොවේ.)

- නිවේදන, හඬකැවීම් සහ ක්‍රීඩා විස්තර විචාරය යන තරඟ අංශ සඳහා පෙර සූදානම් වීමට අමතර මිනිත්තු 05 ක කාලයක් හිමිවේ.

- සියලුම තරග කටයුතු අපක්ෂපාති ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක අධීක්ෂණය සහ පූර්ණ අනුමැතිය ඔස්සේ සිදුවන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

- වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් දුරකථන අංක හරහා සම්බන්ධ වන්න.
  - පත්මා දිසානායක (මාධ්‍ය ඒකකය භාර ආචාරිනී) - +94 76 366 5292
  - විනුජි අත්තනායක (සභාපති) - +94 76 124 1169
  - සනුති ජයලත් (ලේකම්) - +94 71 603 0626

**නිවේදන**

- නිවේදන තරග අංශය සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන් කනිෂ්ඨ, අන්තර් මධ්‍යම හා ජ්‍යෙෂ්ඨ යන වයස් කාණ්ඩ තුන ඔස්සේ පැවැත්වෙන අතර දෙමළ මාධ්‍ය ඔස්සේ විවෘත තරග අංශයක් ලෙස පැවැත්වේ.
- මෙම තරඟ අංශයන් සඳහා අවශ්‍ය පිටපත් එම අවස්ථාවේදී ඔබට ලබාදෙනු ඇත.
- සිංහල නිවේදන අංශය සඳහා පමණක් සුපිරි දසදෙනාගේ වටයක් පවත්වනු ලැබේ.

**සංස්කරණය**

- සංස්කරණ තරග අංශය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යයන් ඔස්සේ විවෘත තරග අංශයක් ලෙස පැවැත්වේ.
- මෙය කණ්ඩායම් තරග ඉසව්වක් ලෙස පැවැත්වෙන අතර, එක් පාසලකින් ඉදිරිපත් විය හැක්කේ තරගකරුවන් සය දෙනෙකුගෙන් සමන්විත එක් කණ්ඩායමකට පමණි.
- මෙහිදී අප විසින් දෙනු ලබන මාතෘකාවන්ට අදාළ ව කෙටි පුවත්පතක් ඔබ විසින් නිර්මාණය කළ යුතු වේ.
- ඔබ කණ්ඩායමේ සංස්කාරකවරුන්, පුවත්පත් ලිපි රචකයන් සහ කාටූන් චිත්‍ර ශිල්පීන් වැනි පුවත්පතක් නිර්මාණය කිරීමේ කාර්යයට අවශ්‍ය පිරිස ඇතුළත් විය යුතු වේ.
- මේ සඳහා ඔබට පැය තුනක කාලයක් හිමි වේ.
- ඔබ සඳහා අවශ්‍ය වන කඩදාසි පමණක් අප විසින් සපයනු ලැබේ.
- ඔබගේ නිර්මාණයට අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය ඇත්නම් ඒවා ඔබ විසින් සපයා ගැනීමට කටයුතු කල යුතුයි.

**හඬකැවීම්**

- මෙම තරග අංශය සිංහල මාධ්‍යයෙන් පමණක් කනිෂ්ඨ, අන්තර් මධ්‍යම හා ජ්‍යෙෂ්ඨ යන වයස් කාණ්ඩ තුන ඔස්සේ පැවැත්වෙන අතර ඉංග්‍රීසි මාධ්‍ය ඔස්සේ විවෘත තරග අංශයක් ලෙස පැවැත්වේ.
- තරගයට අදාළ වීඩියෝ පට හා තිර පිටපත් තරගාවලිය පැවැත්වෙන අවස්ථාවේ දී ඔබට සපයනු ලැබේ.

**ක්‍රීඩා විස්තර විචාරය**

- මෙම තරග අංශය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන් පමණක් විවෘත තරගයක් ලෙස පැවැත්වේ.
- තරගයට අදාළ වීඩියෝ පට තරගාවලිය පැවැත්වෙන අවස්ථාවේ දී ඔබට සපයනු ඇත.

**කාටූන් චිත්‍ර නිර්මාණකරණය**

- මෙම තරග අංශය කනිෂ්ඨ, අන්තර් මධ්‍යම හා ජ්‍යෙෂ්ඨ යන වයස් කාණ්ඩ තුනෙන් ම පැවැත්වේ.
- අප විසින් ලබා දෙන තේමාවට අනුව ඔබගේ නිර්මාණය පැය දෙකක කාලයක් තුළ දී සිදුකළ යුතුය.
- චිත්‍ර නිර්මාණය සඳහා අවශ්‍ය වන කඩදාසි අප විසින් සපයනු ලැබේ.
- වර්ණ ගැන්වීම සඳහා ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකි අතර එම මාධ්‍ය ඔබ විසින් සපයාගත යුතු ය.

**තාක්ෂණික ඉසව්ව**

- මෙය විවෘත තරග අංශයක් වන අතර ඔබගේ කැමත්ත පරිදි ඉංග්‍රීසි හෝ සිංහල මාධ්‍ය ඔස්සේ තරග කල හැක.
- මෙයට අදාල ප්‍රශ්න පත්‍රය එදින ඔබට ලබාදෙනු ඇත.
- ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා පැය 02 ක කාලයක් හිමිවේ.
- ප්‍රශ්න පත්‍රය අතරතුර ජංගම දුරකතන භාවිතා කිරීම සපුරා තහනම් වේ.

**ගුවන් විදුලි වැඩසටහන් ඉදිරිපත් කිරීම**

- මෙය සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්වලින් මාර්ගගත ක්‍රමයට විවෘත තරග අංශයක් ලෙස පැවැත්වේ.
- එක් පාසලකින් තරගකරුවන් පස් දෙනෙකුට සහභාගී විය හැක.
- මෙයට අදාළ මාතෘකාව ඔබ පාසලේ සම්බන්ධීකාරකවරයෙකු වෙත ලබාදෙනු ඇත.
- මෙහිදී අප දෙන මාතෘකාවට අදාල ව ඔබ විසින් නිර්මාණශීලිව පටිගතකරන ලද, සම්පූර්ණ ගුවන් විදුලි වැඩසටහනක හඬපටය පමණක් අප වෙත ඉදිරිපත් කල යුතුය. (ඔබේ නිර්මාණයට අවශ්‍ය පරිදි ගීත, සංගීත කොටස් ආදිය භාවිතා කල හැක.)
- ඔබගේ නිර්මාණය Google Drive හි වෙනම ගොනුවකට උඩුගත කර, එහි සබැඳිය අප විසින් ඔබගේ පාසලේ සම්බන්ධිකාරකවරයාට ලබා දෙන ගූගල් ෆෝරමය ඔස්සේ 2023/04/14 වන දින මධ්‍යම රාත්‍රී 12 ට පෙර අප වෙත ලැබීමට සැළැස්විය යුතුය.

**ඡායාරූපකරණය**

- මෙම තරග අංශය විවෘත තරග අංශයක් ලෙස පැවැත්වේ.
- ඡායාරූපකරණය සඳහා DSLR කැමරා පමණක් භාවිතා කළ යුතු බව සළකන්න.
- අප විසින් ලබාදෙන මාතෘකාවට අදාළ ව තරගාවලිය පැවැත්වෙන දින පාසල් පරිශ්‍රය තුල දී ලබාගත් ඡායාරූප අප වෙත ඉදිරිපත් කළ යුතුය.
- කිසිදු ඡායාරූපයක් තුළ Watermark යෙදීම සිදු නොකළ යුතුය..
- ඔබ ලබාගත් ඡයාරූප Google Drive හි වෙනම ගොනුවකට උඩුගත කර, එහි සබැඳිය අප විසින් ඔබගේ පාසලේ සම්බන්ධිකාරකවරයාට ලබා දෙන ගූගල් ෆෝරමය ඔස්සේ 2023/04/07 වන දින ප.ව 6ට පෙර අප වෙත ලැබීමට සැළැස්විය යුතුය.

**ග්‍රාෆික නිර්මාණකරණය**

- මෙය විවෘත තරගයක් ලෙස පැවැත්වෙන අතර ඔබට කැමති පරිදි ඉංග්‍රීසි හෝ සිංහල මාධ්‍යයන් ඔස්සේ ඔබගේ නිර්මාණ ඉදිරිපත් කල හැක.
- මෙයට අදාළ මාතෘකාව ඔබ පාසලේ සම්බන්ධීකාරකවරයෙකු වෙත ලබාදෙනු ඇත.
- ඔබගේ නිර්මාණ Google Drive හි වෙනම ගොනුවකට උඩුගත කර, එහි සබැඳිය අප විසින් ඔබගේ පාසලේ සම්බන්ධිකාරකවරයාට ලබා දෙන ගූගල් ෆෝරමය ඔස්සේ 2023/04/14 වන දින මධ්‍යම රාත්‍රී 12 ට පෙර අප වෙත ලැබීමට සැළැස්විය යුතුය.
- නිර්මාණ png හෝ jpeg ආකෘතියෙන් ඉදිරිපත් කල යුතු අතර යොදාගත් මෘදුකාංගයට අදාල ව්‍යාපෘති ගොනුව ද (Project file) ඉදිරිපත් කල යුතුය.

**කෙටි චිත්‍රපට**

- මෙය විවෘත තරග අංශයක් වේ.
- ඔබගේ කෙටි චිත්‍රපටය මිනිත්තු 10 ට වැඩි මිනිත්තු 15 ට නොවැඩි විය යුතුයි.
- කෙටි චිත්‍රපටය නිර්මාණය කල යුතු තේමාව ඔබ පාසලේ සම්බන්ධීකාරකවරයෙකු වෙත ලබාදෙනු ලැබේ.
- තරගය සඳහා එක් පාසලකින් සහභාගී විය හැක්කේ තරගකරුවන් දස දෙනෙකුට පමණි.
- ඔබගේ කෙටි චිත්‍රපටය Google Drive හි වෙනම ගොනුවකට උඩුගත කර එහි සබැඳිය අප විසින් ඔබගේ පාසලේ සම්බන්ධිකාරකවරයාට ලබා දෙන ගූගල් ෆෝරමය ඔස්සේ 2023/04/21 වන දින මධ්‍යම රාත්‍රී 12 ට පෙර අප වෙත ලැබීමට සැළැස්විය යුතුය.

**<u>පුවත් හසුන් නිර්මාණකරණය (Newsletter)</u>**

පුවත් හසුනක් යනු නිශ්චිත මාතෘකාවක් හෝ තේමාවක් පිළිබඳ තොරතුරු, යාවත්කාලීන කිරීම් සිදු කරන ප්‍රකාශනයකි. සාමාන්‍යයෙන් විද්‍යුත් තැපෑලෙන් ලබා දෙන පුවත් පත්‍රිකා සංවිධානයක්, ව්‍යාපාරයක් හෝ පුද්ගලයෙකු සහ ඔවුන්ගේ ප්‍රේක්ෂකයින් අතර සන්නිවේදන මාධ්‍යයක් ලෙස සේවය කරයි. ඒවාට බොහෝ විට ලිපි, නිවේදන, මෑත සිදුවීම්වල සාරාංශ සහ ග්‍රාහකයින් දැනුවත් කිරීමට සහ නිරත වීමට අදාළ වෙනත් අන්තර්ගතයන් ඇතුළත් වේ. සාමාන්‍යයෙන් අලෙවිකරණය, ප්‍රජා සහභාගීත්වය, අධ්‍යාපනය, හෝ සංවිධානයක් තුළ යාවත්කාලීන බෙදාගැනීම වැනි විවිධ අරමුණු සඳහා භාවිතා වේ.

- මෙම තරඟ අංශය මාර්ගගත ක්‍රමයට, සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
- මෙහිදී ඔබ විසින් අප දෙනු ලබන මාතෘකාවට අදාලව ඉහත සඳහන් ආකාරයට පුවත් හසුනක් නිර්මාණය කල යුතු වේ.
- එක් පාසලකින් තරගකරුවන් පස් දෙනෙකුට සහභාගී විය හැක.
- මෙයට අදාළ මාතෘකාව ඔබ පාසලේ සම්බන්ධීකාරකවරයෙකු වෙත ලබාදෙනු ඇත.
- මෙය ඔබ කැමති මෘදුකාංගයකින් (උදා:Microsoft Word) නිර්මාණය කල හැකි අතර pdf ආකාරයෙන් මෘදු පිටපතක් ලෙස අපට යොමු කල යුතු වේ.
- ඔබගේ pdf පිටපත අප විසින් ඔබගේ පාසලේ සම්බන්ධිකාරකවරයාට ලබා දෙන ගූගල් ෆෝරමය ඔස්සේ 2023/04/14 වන දින මධ්‍යම රාත්‍රී 12 ට පෙර අප වෙත ලැබීමට සැළැස්විය යුතුය.